# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 14,218 — 1964 නොවැම්බර් 7 වැනි සෙනසුරාද — 1964 11 7**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වන කොටස: (I) වන ජේදය—සාමාන්‍ය

## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය

**1964 අංක 449**

අ. ආ. කා. අංක එන් 104/64

අග්‍රාණ්ඩුකාරතුමන් විසින්, (393 වන අධිකාරය වන) පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 19 වැනි වගන්තිය යටතේ, මෝටර් රථ ප්‍රවාහණ උප කොමසාරිස්, ශ්‍රී නිමල් මුණසිංහ මහතා 1964 ඔක්තෝබර් 29 වැනි දින සිට, එකී පනත යටතේ 1964 ඔක්තෝබර් 29 වැනි දින පත් කරන ලද, 1964 ඔක්තෝබර් 17 වැනිද මීරිගමදී දුම්රිය පිළිපැනීම පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවේ ලේකම් වශයෙන් පත් කළ බව මෙයින් දනුම් දෙනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

නි. විජේවර්ධන,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1964 නොවැම්බර් 4 වැනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්යාලයේ දී.

11-300

---

## මිළ පාලන දන්වීම්

**අංක කේඑල්. 106 දරණ ආහාර මිල ආඥව** — **හරක් මස්**

### මිළ පාලන පනත

#### ආඥව

කළුතර දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක තැන්පත් චාර්ල්ස් සැම්සන් රණසූරිය වන මම, (173 අධිකාරය) දරණ මිළ පාලන පනතේ 3(2) වගන්තිය හා කියවෙන, 4වෙනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව—

(1) 1964 සැප්තැම්බර් 19 වැනි දින අංක 14,173 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළකරනලද 1964 සැප්තැම්බර් 16 වැනි දින අංක කේඑල්. 105 දරණ මිල ආඥව මේ දන් සිට අවලංගු කරමි.

(2) මෙහි වූ උපලේඛනයේ 2, 3 සහ 4 වන තීරයන්හි සඳහන් මිල, ඒ තීරයන්හි මුදුනේ සඳහන් වර්ගයට හා ශ්‍රෙණියට අයත් හරක් මස් ඒ උපලේඛනයේ 1 වන තීරයේ වූ අනුරූප සටහනෙහි සඳහන් ප්‍රදේශය තුළ විකිණිය යුතු උපරිම මිල ලෙස වහාම ක්‍රියාත්මක කළ යුතුය.

(3) මෙම ආඥවේ කාර්‍ය්‍ය සඳහා—

(අ) ''හරක් මස්'' යන පාඨයට ශීත කළ, ලුණුදමූ හෝ මදක් ශීත කැවූ පිටරටින් ගෙන්වනලද හරක් මස් හා යම් වර්ගයක මාංසාවශේෂ මීට ඇතුළත් නොවන අතර,

(ආ) සතකුගේ මළකුණ විකිණීම සඳහා මස් මඩුවෙහි දී පිළියෙල කොට ඇති අයුරින් (එනම් හිස, හම, බඩවැල්, මාංසාවශේෂ, කුර සහ සාමාන්‍යයෙන් ඉවත් කරනු ලබන කොටස් හැර) විකුණන විට එය ''තනි බර අනුව'' කෙරෙන විකිණීමක් ලෙස සැලකිය යුතුය.

(4) කටු සහිත හරක් මස් විකිණීමේදී ඒ සමග විකුණු කටුවල බර විකුණු මුළු බරින් සියයට 25 කට වැඩි නොවිය යුතු ය.

(5) මෙහි වූ උපලේඛනයේ 1 වැනි තීරයෙහි සඳහන් ප්‍රදේශය ඇතුළතවූ යම් ස්ථානයක ඒ උපලේඛනයෙහි සඳහන් වර්ගයට සහ ශ්‍රෙණියට අයත් හරක් මස් තම සන්තකයෙහි තබාගෙන ඇති සෑම වෙළෙන්දකුම ඒ වර්ගයේ හෝ ශ්‍රෙණියේ හරක් මස් සම්බන්ධයෙන් මේ ආඥව මගින් නියමිත උපරිම මිළ සඳහන් කළ යුතු දන්වීමක් එකී ස්ථානයේ පැහැදිලිව පෙනෙන ලෙය ප්‍රදර්ශනය කළ යුතු ය.

(6) හරක් මස් විකිණිය යුත්තේ නැතහොත් විකිණීම සඳහා ප්‍රදර්ශණය කළ යුත්තේ ඒ සඳහා වෙන්කොට ඇති වෙළඳ පිල්වල පමණක් වූ අතර එම වෙළඳ පිල්වල වෙනත් වර්ගයක හෝ ශ්‍රෙණියක මස් විකිණීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශණය කිරීම නොකළ යුතු ය.

(7) මෙහිවූ උපලේඛනයෙහි 1 වැනි තීරයෙහි සඳහන් ප්‍රදේශය ඇතුළතවූ යම් ස්ථානයක ඒ උපලේඛනයෙහි සඳහන් වර්ගයට සහ ශ්‍රෙණියට අයත් හරක් මස් තම සන්තකයෙහි තබාගෙන ඇති සෑම වෙළෙන්දකුම ඒ වෙළඳ පිලෙහි එම වර්ගයට සහ ශ්‍රෙණියට අයත් හරක් මස් පමණක් විකුණන බවට ඒ හරක් මස් විකුණන වෙළඳ පිළෙහි පැහැදිලිව පෙනෙන සේ දැන්වීමක් ප්‍රදර්ශණය කළ යුතු ය.

(8) එක් ගණුදෙනුවක් කිරීමේ දී හරක් මස් සමග මාංසාවශේෂ විකුණනු ලබන විට හරක් මස් මාංසාවශේෂවලින් වෙන් කොට කිරා විකිණිය යුතු ය.

(9) සෑම වෙළෙන්දකුම හරක් මස් විකුණන කල්හි, හරක් මස් ගැණුම්කරු විසින් මිලට ගන්නා හරක් මසෙහි සැබෑ බර පහසුවෙන් බලා ගැනීමට හැකි වන සේ තම තරාදිය හෝ තරාදි තැබිය යුතු ය.

(10) මෙහි වූ උපලේඛනයේ සඳහන් වර්ගයේ සහ ශ්‍රෙණියේ හරක් මස් විකුණන සෑම වෙළෙන්දකුම, හරක් මස් ගැණුම්කරු විසින් ඉල්ලා සිටි විට පහත සඳහන් කරුණු දැක්වෙන කුවිතාන්සියක් ඔහුට දිය යුතුය :—

(අ) විකුණූ දිනය ;

(ආ) විකුණූ හරක් මස් ප්‍රමාණය (බර අනුව) ;

(ඇ) විකුණූ හරක් මස් වර්ගය ; සහ

(ඈ) විකුණූ හරක් මස් ප්‍රමාණයට ගෙවූ මිල.

(11) මෙම ආඥාවෙන් උපරිම මිල නියම කරන ලද සෑම ප්‍රදේශයක් තුළම කිසිවකු විසින් උපලේඛනයේ සඳහන් භාණ්ඩය වෙන කිසියම් මසක් හෝ මාංශයක් සමග කළවම් කොට නොවිකිණිය යුතු ය.

(12) උපලේඛනයෙහි සඳහන් භාණ්ඩය විකුණන කල්හි ඒ භාණ්ඩය ඔතා හෝ බහා දෙන කිසියම් ද්‍රව්‍යයක් වෙතොත් එහි මිලද එම උපලේඛනයෙහි 2, 3 සහ 4 වෙනි තීරයන්හි සඳහන් උපරිම මිලට ඇතුළත් විය යුතු ය.

(13) මෙම ආඥාවෙහි කාර්‍ය්‍ය සඳහා ''රාත්තල'' හෙවත් ''රා'' යන්න ඇවර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර ලෙස සැලකිය යුතු ය.

1964 නොවැම්බර් මස 4 වැනි දින පෙ.ව. 9ට කළුතර කච්චේරියේදී අත්සන් කරන ලදි.

සී. ඇස්. රණසූරිය,
කළුතර දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිල පාලක.

## උපලේඛනය

### හරක් මස් සඳහා උපරිම මිල

| 1 වෙනි තීරය<br>ප්‍රදේශය | 2 වෙනි තීරය<br>හරක් මස් (කටු රහිත) රාත්තලක උපරිම මිල | 3 වෙනි තීරය<br>හරක් මස් (කටු සහිත) රාත්තලක උපරිම මිළ | 4 වෙනි තීරය<br>හරක් මස් (තනි බර අනුව) රාත්තලක උපරිම මිල |
|---|---|---|---|
| | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| කළුතර පරිපාලන දිස්ත්‍රික්කය ... ... | 0 90 ... | 0 80 ... | 0 70 |

සැලකිය යුතුයි.—මේ මිල ගණන් වලට ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු නියමිත මිල අඩංගු නොවේ. ඒවා උපරිම මිල ගණන්ය. එයින් වැඩි මිලකට විකිණීම නොකළ යුතු ය.

11–305

---

1964 අංක ජී. 6 දරණ මිල නියෝගය — තිරිඟු පිටි

## මිළ පාලන පනත

### නියෝගය

ගාලු පාලන දිස්ත්‍රික්කයේ සහකාර ආහාර මිළ පාලක තැන්පත් ගාර්දියෙ පූංචි හේවගේ බුද්ධදස ද සිල්වා වන මම (173 වන අධිකාරය වන) මිළ පාලන පනතේ 3 (2) දරණ වගන්තිය සමග කියවිය යුතු 4 වෙනි වගන්තිය යටතේ මාවෙත පැවරී තිබෙන බලතල අනුව—

(1) 1963 අගෝස්තු මස 14 වැනි දින අංක 13,728 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1963 අගෝස්තු මස 7 වැනි දින අංක ජී. 7 දරණ මිළ නියෝගය මෙදින සිට මෙයින් අවලංගු කරමි.

(2) මෙයට යාකර ඇති පළමුවෙනි උපලේඛනයේ සඳහන් ද්‍රව්‍යය මෙදින සිට මෙයට යා කර ඇති දෙවැනි උපලේඛනයෙහි පළමුවෙනි තීරයෙහි සඳහන් ගාලු පාලන දිස්ත්‍රික්කය තුළ පිහිටි එක් එක් ප්‍රදේශයන්හි තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තල් 148 ක් විකිණිය හැකි වැඩිම මිළ එහිවූ දෙවැනි උපලේඛණයේ දෙවැනි තීරයේ සඳහන් මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) මෙයට යා කර ඇති පළමුවැනි උපලේඛණයේ සඳහන් ද්‍රව්‍ය මෙදින සිට මෙයට යා කර ඇති දෙවැනි උපලේඛණයේ පළමුවැනි තීරයෙහි සඳහන් ගාලු පාලන දිස්ත්‍රික්කය තුළ පිහිටි එක් එක් ප්‍රදේශයන්හි සිල්ලර වෙළෙන්දෙකු විසින් පාරිභෝගිකයෙකුට විකිණීමේදී ශුද්ධ බර රාත්තලක් විකිණිය හැකි වැඩිම මිළ එහිමවූ දෙවැනි උපලේඛනයේ තුන්වැනි තීරයෙහි සඳහන් මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(4) තිරිඟු පිටි ශුද්ධ බරින් රාත්තල් 148කට වඩා වැඩියෙන් හෝ අඩුවෙන් තොග වශයෙන් ඕනෑම ප්‍රමාණයක් විකිණීමේදී ඊට ගෙවිය යුතු වැඩි ම මිළ ගණන් සාද ගත යුත්තේ මෙයට යා කර ඇති දෙවැනි උපලේඛනයේ දෙවැනි තීරයේ සඳහන් ශුද්ධ බරින් රාත්තල් 148 ක් විකිණිය හැකි වැඩිම තොග මිළ ප්‍රමාණය අනුව සළකා ක්‍රමානුකූලව ගණන් බැලීමෙනි.

(5) තවද, මෙම නියෝගයේ කාර්යය සඳහා—

(අ) මෙයට යාකොට ඇති පළමුවෙනි උපලේඛනයේ සඳහන් ''තිරිඟු පිටි'' යන්නට ඉරිඟු පිටි මිශ්‍ර තිරිඟු පිටිද ඇතුලත්යැයි සළකනු ලැබේ ;

(ආ) තිරිඟු පිටි ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීමද, ශුද්ධබර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් එකවර විකිණීමද, තොග වෙළඳාමක් සේ සළකනු ලැබේ ;

(ඇ) ශුද්ධ බරින් හොණ්ඩරයකට වඩා අඩු තිරිඟු පිටි ප්‍රමාණයක් ආහාරය සඳහා විකිණීම සිල්ලර වෙළඳාමක් සේ සළකනු ලැබේ ;

(6) එසේම මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ කිසියම් ප්‍රදේශයක තිරිඟු පිටි, ඉරිඟු පිටි සමග ඇර, වෙන කිසියම් ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කර නොවිකිණිය යුතු බව මෙම නියෝගයෙන් නියම කරමි.

(7) තවද මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ යම් වාහනයක තිරිඟු පිටි සිය ස්වාමිත්ව යේ හෝ තමාගේ පාලන යටතේ හෝ තබා ගෙන සිටින සෑම වෙළෙන්දෙක්ම එම තිරිඟු පිටි වලින් ප්‍රමාණයක් සුදුසු භාජනයක දමා ඒ පිටි වලම මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිළ උසින් අඟලකට වඩා අඩු නොවූද, ඉලක්කම් වලින් මිළ පුවරුවක සටහන් කොට එම පුවරුවට එම භාජනය ඇඳා එම පිටිද, එම පුවරුවද, ඕනෑම ගනුදෙනු කාරයෙකුට පැහැදිලිව පෙනෙන සේ එකී ස්ථානයේ හෝ වාහනයේ තැබිය යුතු බව මෙයින් නියම කරමි.

(8) එසේම මෙම නියෝගයෙහි කාර්යය සඳහා ''රාත්තල'' හෙවත් ''රා'' යන්නෙන් සළකනු ලබන්නේ ඇවර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද, මෙයින් නියම කරමි.

(9) තවද මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම තිරිඟු පිටි විකුණන සියල්ලෙක්ම තොග වශයෙන් විකිණී මේදී කුවිතාන්සියක් නිකුත් කිරීම අවශ්‍ය බවද සිල්ලර වශයෙන් මිළදී ගන්නා අය ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර සහිත කුවිතාන්සි යක් ඔවුනට දිය යුතු බවද මෙයින් නියෝග කරමි.

(අ) විකුණූ දිනය ;

(ආ) තිරිඟු පිටි විකුණූ ප්‍රමාණය (බර අනුව) ;

(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ; සහ

(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම් වෙළඳාම තොග වශයෙන්ද නැතහොත් සිල්ලර වශයෙන්ද යන වග.

(10) තිරිඟු පිටි විකිණීමේදී ඒ යම් කිසි දෙයක බහාලනු ලැබුයේ නම් හෝ ඔතනු ලැබුයේ නම් එහි මිලත් මෙම නියෝගයේ නියමිත මිළ ගණන් වලට ඇතුලත් බව මෙයින් නියම කරමි.

1964.11.2 පෙ. ව. 11.30 ට ගාල්ලේ දිසාපති කාර්යාලයේදී අත්සන් කරන ලදී.

ජී. පී. බී. ද සිල්වා,
ගාලු පාලන දිස්ත්‍රික්කයේ සහකාර ආහාර මිළ පාලක.

## පළමුවැනි උපලේඛනය

හැඳින්වීම හා වර්ගය—තිරිඟු පිටි

## දෙවැනි උපලේඛනය

| 1 වැනි තීරය<br>ප්‍රදේශය | 2 වැනි තීරය<br>රාත්තල් 148ක ශුද්ධ බර තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. | 3 වැනි තීරය<br>සිල්ලර වශයෙන් ශුද්ධ බර රාත්තලක් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. |
|---|---|---|
| ගාලු නාගරික සීමාව සහ කඩවත් සතර, අක්මීමන ගම්කාර්ය සභා සීමාව, බෝපෙ ගම්කාර්ය සභා සීමාව, පෝද්දල ගම්කාර්ය සභා සීමාව ... ... ... ... ... | 34 48 ... | 0 24½ |
| අම්බලන්ගොඩ පළාත් ආණ්ඩු සභා සීමාව, මාදම්පෙ ගම්කාර්ය සභා සීමාව ... ... | 34 69 ... | 0 24½ |
| වතුගෙදර සුලු නගර සභා සීමාව, කරන්දෙනිය ගම්කාර්ය සභා සීමාව ... ... ... | 34 75 ... | 0 24½ |
| වේරගොඩ ගම්කාර්ය සභා සීමාව, බටපොල ගම්කාර්ය සභා සීමාව ... ... ... | 34 69 ... | 0 24½ |
| අහංගම සුලු නගර සභා සීමාව, කතලුව ගම්කාර්ය සභා සීමාව ... ... ... | 34 77 ... | 0 25 |
| හබරාදූව ගම්කාර්ය සභා සීමාව, (මැලෑගොඩ ගම්මුලාදෑනි කොට්ඨාශය හැර) ... ... | 34 56 ... | 0 24½ |
| මැලෑගොඩ ගම්මුලාදෑනි කොට්ඨාශය ... ... ... ... | 34 53 ... | 0 24½ |
| කෝදගොඩ ගම්කාර්ය සභා සීමාව ... ... ... ... ... | 34 77 ... | 0 25 |
| කෝට්ටව ගම්කාර්ය සභා සීමාව ... ... ... ... ... | 34 80 ... | 0 25 |
| බද්දේගම ගම්කාර්ය සභා සීමාව, වඳුරඹ ගම්කාර්ය සභා සීමාව, තෙලිකඩ මාජුවාන ගම්කාර්ය සභා සීමාව | 34 67 ... | 0 24½ |
| පිටිගල වැයිහේන ගම්කාර්ය සභා සීමාව (පිටිගල ගම්මුලාදෑනි කොට්ඨාශය හැර) ... ... | 35 4 ... | 0 25 |
| පිටිගල ගම්මුලාදෑනි කොට්ඨාශය ... ... ... ... ... | 34 41 ... | 0 24½ |
| පොද්දිවෙල-නියාගම ගම්සභා සීමාව, වැලිවිටිය, දිවිතුර ගම්සභා සීමාව ... ... ... | 35 4 ... | 0 25 |
| දෙඩන්දූව සුලු නගර සභා සීමාව, රත්ගම ගම්කාර්ය සභා සීමාව ... ... ... | 34 42 ... | 0 24½ |
| හික්කඩුව සුලු නගර සභා සීමාව, හික්කඩුව ගම්කාර්ය සභා සීමාව ... ... ... | 34 48 ... | 0 24½ |
| බලපිටිය සුලු නගර සභා සීමාව ... ... ... ... ... | 34 77 ... | 0 25 |
| ඌරගස් මංහන්දිය ගම්කාර්ය සභා සීමාව ... ... ... ... | 34 95 ... | 0 25 |
| කොස්ගොඩ ගම්කාර්ය සභා සීමාව ... ... ... ... ... | 34 83 ... | 0 25 |
| බෙන්තොට ගම්කාර්ය සභා සීමාව ... ... ... ... ... | 34 98 ... | 0 25 |
| ඇල්පිටිය සුලු නගර සභා සීමාව, ඇල්පිටිය ගම්කාර්ය සභා සීමාව ... ... ... | 34 30 ... | 0 24½ |
| නාගොඩ ගම්කාර්ය සභා සීමාව ... ... ... ... ... | 34 94 ... | 0 25 |
| හිනිදුම ගම්කාර්ය සභා සීමාව, ඕපාත ගම්කාර්ය සභා සීමාව, නෙලුව ගම්කාර්ය සභා සීමාව ... | 35 22 ... | 0 25 |

සැළකිය යුතුයි.— මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය හැකි නියම මිළ නොවේ. මේවා ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉහළම මිළ ගණන්ය. මේ ගණන් වලට ඉහලින් ඒ ද්‍රව්‍යයන් විකිණිය නොහැකිය.

11-301 ✓

---

1964 අංක ජී. 5 දරණ ආහාර මිළ නියෝගය — හාල් සහ වී

## මිළ පාලන පනත

### නියෝගය

ගාලු දිස්ත්‍රික්කයේ සහකාර ආහාර මිළ පාලක තැන්පත් ගාර්දියේ පුංචි හේවාගේ බුද්ධදස ද සිල්වා වන මම (173 වන අධිකාරය වන) මිළ පාලන පණතේ 3 (2) දරණ වගන්තිය සමග කියවිය යුතු 4 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී තිබෙන බලතල අනුව—

(1) 1963 ජුලි 29 වැනි දින අංක 13,709 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශිත 1963 ජුලි මස 15 වෙනි දින අංක ජී. 5 දරණ ආහාර මිළ නියෝගය මෙදින සිට මෙයින් අවලංගු කරමි.

(2) මේ මොහොතේ සිට මීට යාකොට ඇති උපලේඛනයේ පළමුවැනි තීරයේ සඳහන් පෙදෙස්වල එම උපලේඛනයේ දෙවැනි තීරයේ විශේෂික මිළ ගණන් ශුද්ධ බරෙන් සහල් හොණ්ඩරයක් විකණය යුතු වැඩිම තොග මිළ ගණන් වන අතර, ඒ මිළ ගණන්වලට වඩා වැඩියෙන් තොග වශයෙන් සහල් නොවිකිණිය යුතු බව මෙයින් නියෝග කරමි.

(3) මේ මොහොතේ සිට මීට යාකොට ඇති උපලේඛනයේ පළමුවැනි තීරයේ සඳහන් පෙදෙස්වල එම උපලේඛනයේ තුන්වැනි තීරයෙහි විශේෂික මිළ ගණන් ශුද්ධ බරින්, සහල් රාත්තලක් විකිණිය යුතු වැඩිම මිළ ගණන් වන අතර, ඒ මිළ ගණන්වලට වඩා වැඩියෙන් සිල්ලර වශයෙන් සහල් නොවිකිණිය යුතු බව මෙයින් නියෝග කරමි.

(4) වෙළඳුන්ට තොග වශයෙන් හෝ සිල්ලර වශයෙන් වී විකිණීමක් වේ නම්, එය ශුද්ධ බරින් හොණ්ඩරයක් හෝ රාත්තලක් විකිණිය හැකි වැඩිම මිළ සහල් හොණ්ඩරයක් හෝ රාත්තලක් විකිණිය හැකි වැඩිම මිළෙන් භාගයක් බව නියම කරමි.

(5) තවද, මෙම නියෝගයෙහි කාර්යය සඳහා—

(අ) මොනම සහල් හෝ වී ප්‍රමාණයක් වුවත්, යළිත් විකිණීම සඳහා විකිණීමක් වුවහොත් ඒ තොග වශයෙන් විකිණීමක් වශයෙන් ගණන් ගත යුතු බවත්,

(ආ) මොනම සහල් හෝ වී ප්‍රමාණයක් වුවත්, පාරිභෝගය සඳහා හෝ පාවිච්චිය සඳහා විකිණීමක් වුවහොත් එම විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් බව ගණන් ගත යුතු බවත්,

(ඇ) තොග වශයෙන් විකුණන ශුද්ධ බර හොණ්ඩරයකට අඩු හෝ වැඩි ඕනෑම සහල් හෝ වී ප්‍රමාණයකට ගෙවිය යුතු වැඩිම මුදල ගණන් ගනු ලබන්නේ මෙහි සඳහන් ශුද්ධ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණීමේ වැඩිම මිළ අනුව බවත්,

(ඈ) "රාත්තල" හෙවත් "රා" යන්නෙන් සළකනු ලබන්නේ ඇවර්ඩුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවත්,

(ඉ) නියමිත සහල් හෝ වී ප්‍රමාණය යන්නෙන් හැඟවෙන්නේ ආහාර පාලන පනත අනුව එවේලට දිය යුතු සහල් ප්‍රමාණය බවත්, මෙයින් නියෝග කරමි.

(6) එසේම මෙම නියෝගයේ සඳහන් සහල් සහ වී විකිණිය හැකි වැඩිම මිළ ගණන් බලපවත්නා සෑම ප්‍රදේශයක ම වෙන ද්‍රව්‍යයන් කවලම් කොට, බාලකොට කිසිවකු විසින් සහල් හෝ වී නොවිකිණිය යුතු බව නියම කරමි.

(7) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ යම් වාහනයක සහල් හෝ වී සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම ඒ සහල් හෝ වී වලින් ප්‍රමාණයක් සුදුසු භාජනයක දමා ඒ සහල් හෝ වී වල මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිළ උසින් අඟලකට වඩා අඩු නොවූ ඉලක්කම්වලින් මිළ පුවරුවක ලියා එම භාජනයට ඇදා එම සහල් හෝ වී ද මිළ පුවරුවද ඕනෑම ගනුදෙනු කාරයෙකුට පැහැදිලිව පෙනෙන සේ එකී ස්ථානයේ හෝ වාහණයේ තැබිය යුතු බව මෙයින් නියම කරමි.

(8) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම සහල් හෝ වී යම් කිසිවකු තොග වශයෙන් විකිණීමක් කළේ නම්, ඒ මිළ දී ගන්නා තැනැත්තාට පහත සඳහන් විස්තර එනම් :—

(අ) විකුණූ දිනය :

(ආ) සහල් හෝ වී විකුණූ ප්‍රමාණය ;

(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;

(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම් වෙළඳාම සිල්ලර වශයෙන්, තොග වශයෙන්ද යන වග ඇතුළත් කුවිතාන්සියක් දිය යුතු බව නියම කරමි. තවද සිල්ලර වශයෙන් මිළ දී ගන්නකු වුවද එසේ කුවිතාන්සියක් ඉල්ලුවහොත් එය දිය යුතු බවද මෙයින් නියම කරමි.

(9) සහල් හෝ වී විකිණීමේ දී එය යම්කිසි දෙයක බහාලනු ලැබුවේ නම්, හෝ ඔතනු ලැබුවේ නම් එහි මිළත් මෙම නියෝගයෙන් නියමිත මිළ ගණන් වලට ඇතුලත් බව මෙයින් නියම කරමි.

1964 නොවැම්බර් මස 2 වැනි දින පෙ.ව. 11ට ගාලු කච්චේරියේ දී අත්සන් කරන ලදී.

ජී. පී. බී. ද සිල්වා,
ගාලු දිස්ත්‍රික්කයේ සහකාර ආහාර මිළ පාලක.

## උපලේඛනය

| 1 වැනි තීරය | 2 වැනි තීරය | | 3 වැනි තීරය |
|---|---|---|---|
| ප්‍රදේශය | ශුද්ධ බරින් හාල් හොණ්ඩරයක් විකිණිය හැකි වැඩිම මිළ | | ශුද්ධ බරින් හාල් රාත්තලක් විකිණිය හැකි වැඩිම මිළ |
| | රු. ශ. | | රු. ශ. |
| ගාලු නාගරික සීමාව සහ කඩවත් සතර අක්මීමන ගම්කාර්ය සහා සීමාව, බෝපෙ ගම්කාර්ය සහා සීමාව, පෝද්දල ගම්කාර්ය සභා සීමාව ... ... ... ... | 14 62 | ... | 0 13¾ |
| අම්බලන්ගොඩ පළාත් ආණ්ඩු සභා සීමාව, මාදම්පෙ ගම්කාර්ය සභා සීමාව ... ... | 14 78 | ... | — |
| වතුගෙදර සුළු නගර සභාව සීමාව, කරන්දෙනිය ගම්කාර්ය සභා සීමාව, වෙරගොඩ ගම්කාර්ය සභා සීමාව, බටපොල ගම්කාර්ය සභා සීමාව ... ... ... ... | 14 78 | ... | 0 14 |
| අහංගම සුළු නගර සභා සීමාව, කතලුව ගම්කාර්ය සභා සීමාව ... ... ... | 14 78 | ... | 0 14 |
| හබරාදූව ගම්කාර්ය සභා සීමාව (මැලැගොඩ ගම්මුලාදැනි කොට්ඨාශය හැර) ... ... | 14 68 | ... | 0 13¾ |
| මැලැගොඩ ගම්මුල දැනි කොට්ඨාශය ... ... ... ... | 14 66 | ... | 0 13¾ |
| කෝදගොඩ ගම්කාර්ය සභා සීමාව ... ... ... ... | 14 84 | ... | — |
| කොට්ටව ගම්කාර්ය සභා සීමාව, බද්දේගම ගම්කාර්ය සභා සීමාව, වඳුරඹ ගම්කාර්ය සභා සීමාව ... | 14 86 | ... | — |
| නෙලිකඩ-මාපුවාන ගම්කාර්ය සභා සීමාව ... ... ... ... | 14 76 | ... | — |
| පිටිගල වැයිහේන ගම් කාර්ය සභා සීමාව තුළ (පිටිගල ගම්මුලාදැනි කොට්ඨාශය හැර) ... | 15 04 | ... | 0 14 |
| පිටිගල ගම්මුලාදැනි කොට්ඨාශය ... ... ... ... | 14 57 | ... | 0 13¾ |
| පෝද්දිවෙල නියාගම ගම්කාර්ය සභා සීමාව තුළ වැලිවිටිය දිවිතුරේ ගම්කාර්ය සභා සීමාව ... | 15 04 | ... | 0 14 |
| දෙඩන්දූව සුළු නගර සභා සීමාව, රත්ගම ගම්කාර්ය සභා සීමාව ... ... | 14 58 | ... | 0 14¼ |
| හික්කඩුව සුළු නගර සභා සීමාව, හික්කඩුව ගම්කාර්ය සභා සීමාව ... ... | 14 62 | ... | 0 13¾ |
| බලපිටිය සුළු නගර සභා සීමාව ... ... ... ... | 14 84 | ... | 0 14 |
| උරගස්මංහන්දිය ගම්කාර්ය සභා සීමාව ... ... ... ... | 14 97 | ... | 0 14 |
| කොස්ගොඩ ගම්කාර්ය සභා සීමාව ... ... ... ... | 14 88 | ... | 0 14 |
| බෙන්තොට ගම්කාර්ය සභා සීමාව ... ... ... ... | 15 0 | ... | 0 14 |
| ඇල්පිටිය සුළු නගර සභා සීමාව, ඇල්පිටිය ගම්කාර්ය සභා සීමාව ... ... | 14 49 | ... | 0 13¾ |
| නාගොඩ ගම්කාර්ය සභා සීමාව ... ... ... ... | 14 96 | ... | 0 14 |
| හිනිදුම ගම්කාර්ය සභා සීමාව, ඔපාත ගම්කාර්ය සභා සීමාව, නෙලුව ගම්කාර්ය සභා සීමාව ... | 15 17 | ... | 0 14¼ |

සැළකිය යුතුයි.—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණීමේ නියම මිළ නොවේ. මේවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉහළම මිළ ගණන් ය. මේ මිළ ගණන් වලට ඉහලින් ඒ ද්‍රව්‍යයන් විකිණිය නොහැකිය.

අංක කේශු/52/64 දරණ ආහාර මිළ නියෝගය

ශුද්ධ නොකළ දුඹුරු සීනි

## මිළ පාලන පනත

### ආඥාව

කුරුණෑගල පාලන දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිල පාලක තැන්පත්, වාල්ස් අබේදීර වන මම "(173 වන අධිකාරය වන) මිළ පාලන පනතේ" 4 වෙනි ඡේදය හා 3 (2) වෙනි ඡේදයන්ගෙන්ද මාවෙත පැවරී ඇති බලතල අනුව—

(1) 1963 දෙසැම්බර් මස 3 වැනි දින හා අංක 13,843 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පලකරන ලද අංක කේශු/41/63 හා 1963 නොවැම්බර් මස 28 වෙනි දින දරණ ආහාර මිළ නියෝගය මේ දුන් සිට අවලංගු කරමි.

(2) තවද, මීට යාකර ඇති උපලේඛනයේ පළමුවැනි තීරයේ සඳහන් ශුද්ධ නොකළ දුඹුරු සීනි තොග වශයෙන් විකිණීමේදී දළ බර හොන්ඩර යක්ද සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක්ද උපලේඛනයේ දෙවෙනි තීරයේ සඳහන් පෙදෙස් ඇතුළත විකිණිය හැකි වැඩිම මිළ මේ දුන් පටන් මේ උපලේඛනයේ තුන්වැනි හා හතරවැනි තීරවල අනුපිළිවෙලින් සඳහන් කර තිබෙන මිළ ගනන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) තවද මෙම නියෝගයේ කාර්ය සඳහා—

(අ) උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ශුද්ධ නොකළ දුඹුරු සීනි ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ වරකට දළ බර හොන්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් බැගින් කොයි අන්දමකට විකිණීම හෝ තොග වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත්,

(ආ) උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ශුද්ධ නොකළ දුඹුරු සීනි පාරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ දළ බර හොන්ඩර යකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත්,

(ඇ) "ශුද්ධ නොකළ දුඹුරු සීනි" වලට කිසිම හකුරු වර්ගයක් ඇතුළත් නොවිය යුතු බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

(4) එසේම මෙම නියෝගයේ වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම ශුද්ධ නොකළ දුඹුරු සීනි වෙන ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාලකොට කිසිවකු විසින් නොවිකිණිය යුතු බවත් නියම කරමි.

(5) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ යම් වාහනයක උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ශුද්ධ නොකළ දුඹුරු සීනි සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ හෝ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම ශුද්ධ නොකළ දුඹුරු සීනි ප්‍රමාණයක් සුදුසු භාජනයක දමා එම සීනි සඳහා මේ නියෝගයෙන් වැඩිම මිළ උසින් අඟලකට වඩා අඩු නොවූ ඉලක්කම්වලින් මිළ පුවරුවක යටහත් කොට එම භාජනයට සම්බන්ධ කොට එකී ශුද්ධ නොකළ දුඹුරු සීනි හා නියමිත වැඩිම මිළ ඕනෑම ගනුදෙනුකාරයෙකුට පැහැදිලිව පෙනෙන සේ එකී ස්ථානයේ හෝ වාහනයේ තැබිය යුතු බව නියම කරමි.

(6) එසේම මෙම නියෝගයේ කාර්ය සඳහා "රාත්තල" හෙවත් "රා" යන්නෙන් සලකනු ලබන්නේ ඇවර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

(7) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම, උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ශුද්ධ නොකළ දුඹුරු සීනි තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු හා උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ශුද්ධ නොකළ දුඹුරු සීනි සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු විසින්ම මිළයට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණු දිනය,

(ආ) ශුද්ධ නොකළ දුඹුරු සීනි විකුණු ප්‍රමාණය (බර අනුවයි),

(ඇ) විකුණු ශුද්ධ නොකළ දුඹුරු සීනි ප්‍රමාණය සඳහා ගෙවූ මුදල.

(ඈ) වෙළඳාමේ ස්වභාවය එනම්, වෙළඳාම තොග වශයෙන්ද, සිල්ලර වශයෙන්ද යන වග ඇතුලත් කුවිතාන්සිය මිළයට ගන්නාට දිය යුතු බවද නියම කරමි.

(8) උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ශුද්ධ නොකළ දුඹුරු සීනි විකුණනවිට ඒ විකුණන ලබන ශුද්ධ නොකළ දුඹුරු සීනි යම්කිසි දෙයක ඔතනු ලැබේ නම් එහි මිළත් උපලේඛනයේ 3 වැනි හා 4 වැනි තීරවල සඳහන් වැඩිම මිළ ගණන්වලට ඇතුළත් වන බවද නියම කරමි.

1964 නොවැම්බර් මස 2 වැනි දින ප.ව. 4ට කුරුණෑගල කච්චේරියේදී අත්සන් කරන ලදී.

ඩී. අබේදීර,
කුරුණෑගල දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක.

### උපලේඛනය

| 1 වැනි තීරය වර්ගය | 2 වැනි තීරය ප්‍රදේශය | 3 වැනි තීරය දළබර හොන්ඩරයක් විකිණිය හැකි වැඩිම මිළ රු. ශ. | 4 වැනි තීරය ශුද්ධබර රාත්තලක් විකිණිය හැකි වැඩිම මිළ රු. ශ. |
|---|---|---|---|
| ශුද්ධ නොකළ දුඹුරු සීනි | කුරුණෑගල නාගරික සීමාව තුළ | 68 33 | 0 63½ |
| | කුලියාපිටිය පළාත් ආණ්ඩු සභා සීමාව තුළ | 68 34 | 0 63½ |
| | පොල්ගහවෙල සුළු නගර සභා සීමාව තුළ | 68 31 | 0 63½ |
| | පහත සඳහන් ගම්කාර්ය සභා සීමාවන් තුළ— | | |
| | අලව්ව | 68 31 | 0 63½ |
| | බින්ගිරිය | 68 37 | 0 64 |
| | බෝයගනේ | 68 33 | 0 63½ |
| | දඹදෙණිය | 68 31 | 0 63½ |
| | දුම්මලසූරිය | 68 31 | 0 63½ |
| | හමන්ගල්ල | 68 34 | 0 63½ |
| | හොරොම්බාව | 68 34 | 0 63½ |
| | කළුගමුව | 68 53 | 0 64 |
| | මාකඳුර | 68 30 | 0 63½ |
| | මුරුතැන්ගෙ | 68 34 | 0 63½ |
| | නාරම්මල | 68 31 | 0 63½ |
| | පන්නල | 68 22 | 0 63½ |

උපලේඛනය-සම්බන්ධයි

| 1 වැනි තීරය<br>වර්ගය | 2 වැනි තීරය<br>ප්‍රදේශය | 3 වැනි තීරය<br>දළබර හොණ්ඩරයක් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. | 4 වැනි තීරය<br>ශුද්ධ බර රාත්තලක් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. |
|---|---|---|---|
| ශුද්ධ නොකළ දුඹුරු සීනි ... | පිදුම ... | 68 34 | 0 63½ |
| | පිලැස්ස ... | 68 43 | 0 64 |
| | පොල්ගහවෙල | 68 31 | 0 63½ |
| | පොතුහැර | 68 31 | 0 63½ |
| | උඩුබද්දව | 68 34 | 0 63½ |
| | වැල්ලව ... | 68 33 | 0 63½ |
| | හිරිපිටිය ... | 68 53 | 0 64 |
| | බලල්ල ... | 68 53 | 0 64 |
| | දෙඩන්ගස්ලන්ද | 68 49 | 0 64 |
| | ගොකරැල්ල | 68 49 | 0 64 |
| | හෙට්ටිපොල | 68 40 | 0 64 |
| | කටුපොත ගම | 68 40 | 0 64 |
| | මාහෝ ... | 68 53 | 0 64 |
| | නිකවැරටිය | 68 53 | 0 64 |
| | රම්බොඩගල්ල | 68 53 | 0 64 |
| | වාරියපොල | 68 50 | 0 64 |
| | වැළඩ ... | 68 53 | 0 64 |
| | අඹන්පොල | 68 53 | 0 64 |
| | ඇහැටුවැව | 68 68 | 0 64 |
| | ගල්ගමුව | 68 60 | 0 64 |
| | මතනන්නේරිය | 68 60 | 0 64 |
| | පොල්පිතිගම | 68 60 | 0 64 |
| | තඹරොම්ඹුව | 68 53 | 0 64 |

සැලකිය යුතුයි.—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු නියමිත මිළ නොවේ. මේවා ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉතාම වැඩි මිළ ගණන්ය. එම මිළ ගණන්වලට ඉහළින් ඒ ද්‍රව්‍ය විකිණිය නොහැකිය.

11–303

---

# ශ්‍රී ලඞකා මහ බැංකුවේ දැන්වීම්

## ශ්‍රී ලංකා මහ බැංකුව

### 1964 ඔක්තෝබර් මස 31 වැනි දිනට ශේෂ පත්‍රය

(මුදල් නීති පනතේ 34 වැනි (පරිච්ඡේදය 422) වගන්තියට අනුව)

| වගකීම් | රු. | රු. |
|---|---|---|
| **ප්‍රාග්ධන ගිණුම්** | | |
| ප්‍රාග් ධනය ... ... | 1,50,00,000 | |
| අතිරික්තය ... ... | 5,20,00,000 | |
| | | 6,70,00,000 |
| **වගකීම්** | | |
| සංසරණයෙහි පවත්නා නෝට්ටු ... | 85,74,86,389 | |
| සංසරණයෙහි පවත්නා කාසි ... | 5,02,00,121 | |
| | | 90,76,86,510 |
| නිකුත් කළ හා බේරීමට ඇති ණයපත් ... | | 5,33,94,000 |
| **තැන්පතු** | | |
| රජය ... ... | 21,38,185 | |
| රාජ්‍ය නියෝජ්‍යත්ව හා සංස්ථා ... | 58,11,426 | |
| වෙළඳ බැංකු ... ... | 13,44,41,187 | |
| ජාත්‍යන්තර සංවිධාන, විදේශීය රාජ්‍ය හා විදේශීය බැංකු ආයතන ... ... | 18,90,05,355 | |
| අනෙකුත් ... ... | 32,92,740 | |
| | | 33,46,88,893 |
| විදේශීය ණය ගැනීම් ... ... ... | | 1,19,04,762 |
| අනෙකුත් වගකීම් හා ගිණුම් ... ... | | 15,15,18,450 |
| | | 1,52,61,92,615 |

| වත්කම් | රු. | රු. |
|---|---|---|
| **ජාත්‍යන්තර සංචිතය** | | |
| පිටරට තිබෙන මුදල් හා බැංකු ශේෂයන් (භාණ්ඩාගාර බිල්පත් ඇතුළුව) | 4,09,20,674 | |
| * විදේශීය රාජ්‍ය ණයපත් ... | 6,82,99,408 | |
| | | 10,92,20,082 |
| **දේශීය වත්කම්** | | |
| ණය සහ අත්තිකාරම්— | | |
| †රජයට ... ... | 20,36,94,042 | |
| අනෙකුත් අයට ... | 68,50,000 | |
| රජයේ හා රජය සහතික කළ ණයපත් | 1,14,92,29,211 | |
| | | 1,35,97,73,253 |
| අනෙකුත් වත්කම් හා ගිණුම් ... | | 5,71,99,280 |
| | | 1,52,61,92,615 |

* 1964 පෙබරවාරි 1 වැනි දින රු. 5,33,39,999 ක ප්‍රකාශිත වටිනාකමට රජයේ ආයතන වලින් ලබාගත් ණයපත් ඇතුළත්වේ. එදිනට මෙකී ණයපත් වල ඇස්තමේන්තු කළ වෙළෙඳ වටිනාකම රු. 4,39,16,104 ක් විය.

† 1961 අංක 7 දරන ජාත්‍යන්තර සංවර්ධන සංගම් ගිවිසුම් පනතේ සහ සංශෝධිත බ්‍රෙටන්වුඩ් ගිවිසුම් පනතේ (424 පරිච්ඡේදය) නියමයන් ප්‍රකාර ජා. මු. ම., ජා. ප්‍ර. ස. බැ. හා ජා. ස. ස. ට ලංකාවේ දායක මුදල් වශයෙන් ගෙවීම සඳහා වූ රු. 3,96,94,042 ක විශේෂ ණය ද ඇතුළත් වෙයි.

ඩී. සී. ගුණසේකර,
නියෝජ්‍ය අධිපති.

එස්. ඩී. අමරසිංහ,
ප්‍රධාන ගණකාධිකාරී.

ඉහත සඳහන් ශේෂ පත්‍රය මගේ විධානය යටතේ පරීක්ෂා කරන ලදී. මහ බැංකුවේ පොත් හා වාර්තා සහ මා වෙත සපයා ඇති තොරතුරු හා විස්තර අනුව, 1964 ඔක්තෝබර් මස 31 වැනි දිනට බැංකුවේ කටයුතු පිළිබඳ පැවැති තත්ත්වය සාධාරණව හා සත්‍යව පිළිබිඹු වන පරිදි, ශේෂ පත්‍රය නිසි ලෙස සකස් කොට ඇති බව මගේ අදහස වෙයි.

බී. එල්. ඩබ්ලිව්. ප්‍රනාන්දු,
ඔඩිටර් ජනරාල්.

1964 නොවැම්බර් මස 7 වැනි දින , කොළඹ දී ය.

11–325

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## රේගු නිවේදනය අංක 61/9/155

ආදායම් රක්ෂණ ආඥාපනත (250 වෙනි අධිකාරය) යටතේ අංක 12,781 හා 1961 නොවැම්බර් මස 24 වැනි දින දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලදුව, 1962 මාර්තු 14 වන දින නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් සම්මත කරන ලද ආඥාව අනුව, 1964 නොවැම්බර් මස 9 වෙනි සඳු දිනෙන් අරම්භවන සතිය සඳහා නොම්මර එකේ ආර්. එස්. එස්. රබර රාත්තලක තක්සේරු කරන ලද එෆ්. ඕ. බී. වටිනාකම හා ඕනෑම වර්ගයක රබර් සඳහා අපනයන තීරු ගාස්තු පහත දක්වේ.

මේ තීරු ගාස්තුව රේගු ආඥාපනත හැර අන් කිසි ලිඛිත නීතියක් යටතේ ගෙවිය යුතු තීරු ගාස්තුවලට අතිරේක වශයෙනි :—

| රබර් | රු. | ශ. |
|---|---|---|
| නොම්මර එකේ ආර්. එස්. එස්. රබර් සඳහා තක්සේරු කරන ලද එෆ්. ඕ. බී. වටිනාකම—රාත්තලකට ... ... | 1 | 12 |
| ඕනෑම වර්ගයක රබර් සඳහා අපනයන තීරුව—රාත්තලකට ... ... ... ... .. | 0 | 10 |

ග. කුමාරණතුංග,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

අංක ඒ 781,
1964 නොවැම්බර් මස 7 වෙනි දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දීය.

11–362

---

## රේගු දැන්වීම අංක 64/5/14

1964 අගෝස්තු මස 8 වෙනි දින අංක 14,138 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලදුව, 1964.10.16 වෙනි දින නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් සම්මත කරගත් 1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනතේ 2 වන ඡෙදය යටතේ පැනෙන ආඥාව ක්‍රියාත්මක කිරීම සඳහා, 1964 නොවැම්බර් මස 9 වෙනි සඳු දිනෙන් ආරම්භ වන සතිය සඳහා ලන්ඩන් වෙළඳපොලෙහි පිලිප්පයින් කොප්පරාවල තක්සේරු කරනු ලැබූ රක්ෂණ හා වාහන ගාස්තු ඇතුළත් වටිනාකම ටොන් එකක් අමෙරිකානු ඩොලර් 199 3/5 වන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2. කොප්පරා, පොල්තෙල්, කපාපු පොල් හා ගෙඩි පොල් සඳහා ගෙවිය යුතු අපනයන තීරු ගාස්තු මෙහි පහත පෙනෙන පරිදි වේ :—

| කොප්පරා ටොන් එකක් සඳහා අපනයන තීරුව | | පොල්තෙල් ටොන් එකක් සඳහා අපනයන තීරුව | | කපාපු පොල් ටොන් එකක් සඳහා අපනයන තීරුව | | අමු පොල් ගෙඩි 1,000ක් සඳහා අපනයන තීරුව |
|---|---|---|---|---|---|---|
| රු. ශ. | | රු. ශ. | | රු. ශ. | | රු. ශ. |
| 251 26 | ... | 221 43 | ... | 188 04 | ... | 62 82 |

3. මෙම තීරු ගාස්තු රේගු ආඥාපනත හැර අන් කිසි ලිඛිත නීතියක් යටතේ ගෙවිය යුතු තීරු ගාස්තුවලට අතිරේක වශයෙනි.

ග. කුමාරණතුංග,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

අංක ඒ 744/22.
1964 නොවැම්බර් මස 7 වෙනි දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දීය

11 361

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි " ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන් " හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි